# වර්තමාන ශ්‍රී ලංකාවේ සංඝ සංස්ථාව මුහුණ දෙන අභියෝග පිළිබඳ සමාලෝචනයක්

**කිරම විමලතිස්ස හිමි**

මහාවංසය, දීපවංසය ඇතුළු ඓතිහාසික මූලාශ්‍රයවලට අනුව ශ්‍රී ලංකාද්වීපය තුළ විධිමත් ශිෂ්ටාචාරයක් ගොඩනැගෙන්නේ බුදුදහම ලැබීමෙන් පසුවය. ක්‍රි.පූ. තෙවැනි සියවසේ මිහිඳු මහරහතන් වහන්සේගේ ප්‍රධානකොට ගත් ධර්මදූතයන් විසින් බුදුදහම මෙරටට හඳුන්වා දුන් බව වංසකථාවල සඳහන් වේ. මහින්දාගමනයෙන් පසු මෙරට බිහි වූ ප්‍රධාන භික්ෂු මධ්‍යස්ථානය වූයේ මහාවිහාරයයි. එසේම ලක්දිව බුදුදහමේ කේන්ද්‍රස්ථානය වශයෙන් සැලකෙන්නේ ද මහාවිහාරයයි. රුහුණේ සිතුල්පව්ව, තිස්සමහාරාමය ඇතුලු ලක්දිව විවිධ ප්‍රදේශවල බිහි වූ විහාරස්ථානවල ආරම්භය සිදුවූයේ මහාවිහාරය කේන්ද්‍ර කරගනිමිනි. ආරම්භයේ සිට රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලැබීම නිසා ලක්දිව බුදුසසුනේ පැවැත්මට දැඩි අභියෝග එල්ල වූ බවක් නොපෙනේ. එහෙත් කාලයාගේ ඇවෑමෙන් බාහිරින් මෙන්ම සංස්ථාව තුළින් ද විවිධ ගැටලුකාරී තත්ත්වයන් උද්ගත වූ බව පෙනෙන්නට තිබේ. ලක්දිව බුදුදහමේ ඉතිහාසය දෙස බලන විට පැහැදිලි වන්නේ බාහිර අභියෝගවලට වඩා ඇතැම්විට ප්‍රබල වූයේ අභ්‍යන්තර අර්බුද බවයි. කිසිම සංස්ථාවක් ගැටලුවලින් තොරව අඛණ්ඩව ඒකාකාරීව පවත්වාගෙන යාමට නොහැකිය. අභ්‍යන්තරය තුළ යම් දෙදරීම් හා පරිහානීය ස්වභාවයන් දැකගත හැකිය. එහෙත් එම ගැටලු සහ අභියෝග විසඳගෙන හෝ මැඩපවත්වාගෙන බුදුසසුන ඉදිරියට ගෙන යාමට එම යුගවල වැඩසිටි මහතෙරුන් වහන්සේලා කටයුතු කළ අයුරු ඉතිහාසය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. බොහෝවිට රාජ්‍ය අනුග්‍රහයද ඒ සඳහා ලබාගත් අයුරු දැකිය හැකිය.

වර්තමාන ලක්දිව භික්ෂු සංස්ථාව දෙස බලන විට ගැටලු හා අභියෝග ගණනාවකට මුහුණ දෙමින් සිටින බව පෙනෙන්නට තිබේ. මෙම ගැටලු ප්‍රධාන වශයෙන් දෙයාකාරව හඳුනා ගත හැකිය.

01. බාහිරින් ශාසනයේ පැවැත්මට තිබෙන අභියෝග

02. භික්ෂු සංස්ථාව තුළින් මතු වී තිබෙන අර්බුද

මෙහි දී විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ භික්ෂු සංස්ථාව තුළින්ම ඇති වෙමින් පවත්නා යම් ගැටලුකාරී ස්වරූපයන් හඳුනාගැනීම කෙරෙහිය.

බුදුසසුන ආරක්ෂා කරගැනීමේ දී මූලික වගකීම පැවරෙන්නේ භික්ෂූන් වහන්සේලාටයැයි පැවසීම වරදක් නොවේ. ඉතිහාසය දෙස බලන විට විවිධ යුගවල සිටි රජවරු ශාසනය අර්බුදකාරී තත්ත්වයන්ට පත්වූ අවස්ථාවලදී නන් අයුරින් මැදිහත් වුවද එහි පිටුපස සිටියේ එවකට වැඩ සිටි මහතෙරවරුය. උන්වහන්සේලා ශාසනය තුළ දැඩි අර්බුද ඇති වූ අවස්ථාවන්වලදී ශාසන හිතෛෂී රජවරුන්ගේ සහය ලබාගෙන එම ගැටලු විසඳගැනීමට කටයුතු කළහ. ප්‍රථම, ද්විතීය හා තෘතීය ධර්ම සංගායනා දෙස බැලීමේදීත් ලංකා ඉතිහාසය දෙස බැලීමේදීත් මෙම කරුණ මනාව පැහැදිලි වේ.

ලංකා ආණ්ඩුව බුදුදහම පෝෂණය කොට ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බැඳී සිටී.[1] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබූ පමණින්ම පත්වන සෑම රජයක්ම ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමක් අපේක්ෂා කළ නොහැකිය. ඒ සඳහා අවශ්‍ය වැඩසටහන් සැකසිය යුත්තේ භික්ෂූන් වහන්සේලා විසින්ම ය. සුදුසු වැඩ පිළිවෙළක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය මැදිහත් වීමක් අවශ්‍ය නම් එය ලබාගැනීමට කටයුතු කළ යුතුය. එබැවින් අභ්‍යන්තර හෝ බාහිරව ශාසනය අභියෝගවලට මුහුණ දේ නම් එය විසඳ ගැනීමේ මූලික වගකීම පවතින්නේ භික්ෂූන් වහන්සේලා සතුවය. එහෙත් වර්තමාන ශාසනික භාරකාර භික්ෂූන් වහන්සේලා විසින් මෙම කරුණු නිසි පරිදි අවබෝධ කරගෙන ඇති බවක් නොපෙනේ.

මෑත ඉතිහාසය තුළ විටින්විට බුදුසසුන සහ භික්ෂූන් වහන්සේලා මුහුණ දෙන විවිධාකාර ගැටලු සම්බන්ධයෙන් කතිකාවත් ගොඩ නැගුන බව පෙනේ. ඇතැම්විට භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් විවිධ නම්වලින් යුතු සංවිධාන පිහිටුවාගෙන ඒ තුළින් රජයට සහ විවිධ පාර්ශ්වවලට බලපෑම් සිදු කරන අයුරු සුලබව දැකගත හැකිය. එහෙත් එම සංවිධානවල බොහෝ ක්‍රියාකාරකම් කාලයත් සමගම ආරම්භයේදී ඇතිකර ගත් සිය මූලික පරමාර්ථවලින් බැහැර වී වෙනත් අරමුණු සාධනය සඳහා මෙහෙයවන අයුරක් පෙනීයයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන්නේ එම සංවිධාන සඳහා නායකත්වය ලබාදෙන භික්ෂූන් වහන්සේලාගේ හෝ පුද්ගලයින්ගේ හැසිරීමත් එම සංවිධාන විවිධ දේශපාලකයින් හෝ දේශපාලන පක්ෂ විසින් සිය දේශපාලන අරමුණු සඳහා මෙහෙයවීමට කටයුතු කිරීමත් බව පෙනේ. එසේම ශාසනික ගැටලු සඳහා බලපෑම් කළ හැකි කණ්ඩායම් නිහඬව සිටීම නිසා ද රජය මෙම ගැටලු විසඳීම කෙරෙහි දැඩි උනන්දුවක් නැතිබව පෙනේ. උදාහරණයක් ලෙස 2002 බුද්ධ ශාසන ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ තවමත් නිසිපරිදි ක්‍රියාවට නංවා නොමැත.[2] බොහෝවිට එම කරුණු ක්‍රියාවට නැන්වීමට භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීමක් ද දැක ගත නොහැකිය. භික්ෂූන් වහන්සේලාගේ මෙම ඇල්මැරුණු ස්වභාවය නිසාම එම ගැටලු ඒ ලෙසම, ඇතැම්විට පෙරටත් වඩා උග්‍ර තත්ත්වයට පත් වී තිබේ. ඒ අනුව මෙම ලිපිය තුළින් අපේක්ෂිත අරමුණ වන්නේ වර්තමාන ලාංකීය භික්ෂු සංස්ථාව මුහුණ දෙන අභියෝග කිහිපයක් ගැන අවධානය යොමු කරමින් බුද්ධිමය සංවාදයක් ගොඩනැගීමයි.

වර්තමාන ශ්‍රී ලංකාවේ ශාසනය තුළ පවතින්නේ බහුනායකත්වයකි. කිසියම් ආගමික, දේශපාලනික හෝ වෙනත් සංස්ථාවක් තුළ බහුනායකත්වයක් පවතින්නේ නම් එහි මතභේද පැන නැගීම ස්වාභාවිකය. බුදුරදුන් පුද්ගල නායකත්වය වෙනුවට ධර්ම විනය නායකත්වයෙහි තබාගැනීමට උපදෙස් ලබා දුන්නේය.[3] එයට හේතුව පුද්ගල නායකත්වය ගැටලුවලට මග පාදන බැවින් විය හැකිය. ඒ වෙනුවට උන්වහන්සේ 'සංඝ' නමින් හඳුන්වන

පුද්ගල නායකත්වයෙන් තොර පොදු පරිපාලන ව්‍යුහයක් භික්ෂූන්ට ඇතිවන ගැටලු විසඳගැනීම සඳහා හඳුන්වා දුන්හ.[4]

එහෙත් කාලානුරූපව බුද්ධශාසනය ව්‍යාප්ත වීමේදී පුද්ගල නායකත්වයක අවශ්‍යතාව මතු වූ අයුරු පෙනේ. බුදුරදුන්ගේ පරිනිර්වාණයෙන් පසු ඇති වූ ශාසනික ගැටලු විසඳීම සඳහා මහාකාශ්‍යප තෙරුන් නිල නොලත් නායකයෙක් ලෙස ක්‍රියාත්මක විය.[5] දෙවැනි හා තෙවැනි ධර්ම සංගායනා හා ඒ සඳහා මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේලා දෙස බැලීමේදී ද එම කරුණ තහවුරු වේ. ලංකාවේද අනුරාධපුර යුගය හැර පොළොන්නරු යුගයේ සිට මහනුවර යුගයේ වෙන්වෙන් නිකායයන් හා නිකාය ප්‍රධාන ස්වාමින් වහන්සේලා බිහි වන තෙක් 'මහාසාමි' හෝ 'සංඝරාජ' යනුවෙන් පොදු භික්ෂු නායකත්වයක් පැවතියේය. 12 වන සියවසෙහි දෙවැනි පැරකුම්බා රාජ්‍ය සමයේ පිහිටු වූ දඹදෙණි කතිකාවතෙහි ''බහු නායකත්වය නම් ශාසන විලෝපනයට ඒකාන්ත හේතු...'' යනුවෙන් පැහැදිලිවම බහු නායක්වය ශාසනයේ ගැටලු සඳහා හේතු වන බව දක්වා තිබේ.[6] එසේම මෙම යුගයේ පැවැති භික්ෂූ නායකත්වය සැදුම් ලද්දේ මහාසාමි, මහාථෙර දෙනම, මූලාධිපති අටනම, පිරිවෙන්පති හිමිවරු හා ගණදෙටු හිමිවරු යන සීමිත ශාසනික තනතුරුවලිනි. එසේම ඉහළ තනතුරු පුරප්පාඩු වූ විට පහළ තනතුරුවලින් එම පුරප්පාඩු වූ තනතුර සම්පූර්ණ කරයි. එසේම එක් කාලයකට මෙම 'මහාසාමි' පදවිය දැරිය හැකි වන්නේ එක් අයෙකුට පමණක් බව දඹදෙණි කතිකාවතේ දැක්වේ.[7] ''මේ මහතෙර දෙදන මුත් අන්කිසියම් ද කෙනෙක් මහතෙර නොකටයුතුය'' යනුවෙන් කතිකාවතෙහි දක්වා තිබීමෙන් පැහැදිලි වන්නේ ලක්දිවටම එකල තිබී ඇත්තේ මහාථෙර තනතුරු දෙකක් පමණක් බවය. මහාසාමි තනතුර හිස් වූ විට එය සම්පූර්ණ කරන්නේ මහාථෙර පදවි දෙකෙන් එක් අයෙකුගෙනි.

වර්තමානයේ ලංකාවේ පවත්නා ශාසනික සම්ප්‍රදායයන් ආරම්භ වන්නේ මහනුවර යුගයෙන් පසුවය. ඒ අනුව සංඝ සංස්ථාව තුළ සියම්, රාමඤ්ඤ හා අමරපුර යනුවෙන් නිකායයන් තුනක් බිහිවූ අතර එම නිකායයන් තුළ තවතවත් අභ්‍යන්තර

බෙදීම් ඇති වී මහානායක පදවි, අනුනායක පදවි මුල් කරගත් ප්‍රාදේශීය නායකත්වයන් දක්වා විහිදී යන සාසනික තනතුරු විශාල ප්‍රමාණයක් බිහිවී ඇත. මෙම පදවි හොබවන ස්වාමීන් වහන්සේලා විසින් තම නිකායේ හෝ පාර්ශ්වයේ භික්ෂූන් වහන්සේලා හා විහාරස්ථාන සම්බන්ධයෙන් ඇතිවන ගැටලු විසඳීම සඳහා මැදිහත්වන අතර ඒ තුළින් ශාසනයේ පැවැත්මට සුවිශාල මෙහෙයක් සිදුවන බව සැබෑය. එහෙත් කෙතරම් ශාසනික තනතුරු බිහිවුවත් මේ දක්වා විසඳාගැනීමට නොහැකි වූ ශාසනික අභියෝග හා ගැටලු ගණනාවක් ඇත. ඒ අතර දේශපාලන, අධ්‍යාපනය, ධර්මය හා ශාසනික සම්ප්‍රදායයන් විකෘති කිරීම්, අන්‍යාගමික බලපෑම්, බෞද්ධ පුරාවස්තු මංකොල්ලය, ඇතැම් භික්ෂූන්ගේ දැඩි අවිනයවාදී හැසිරීම් වැනි ගැටලු රැසක් පෙන්වාදිය හැකිය. විටින්විට මෙවැනි ගැටලු සම්බන්ධයෙන් සංවාදයන් ආරම්භ වූවද එම සාකච්ඡාවන් බහුතරයක් විසඳුමකින් තොරව අවසන් වූ බව පෙනේ. නවීකරණය වන සමාජයත් සමග ඇතැම් ගැටලු සඳහා විනයානුකූලව පිළිතුරු සෙවීම අපහසු වුවත් පොදු සම්මතයන් තුළින් ප්‍රතිපත්තිමය තීරණවලට එළඹිය හැකිය.

තායිලන්තය, බුරුමය වැනි සෙසු ථෙරවාද බෞද්ධ රටවල භික්ෂු සංස්ථාවේ ගැටලු විසඳන ක්‍රමවේද ලංකාවට වඩා වෙනස් බව පෙනේ. එම දෙරටෙහිම තවමත් භික්ෂූන් වහන්සේලාගේ නායකත්වය දරන්නේ සංඝරාජ ස්වාමීන් වහන්සේලා දෙනමකි. සම්ප්‍රදායයන් කිහිපයක් තිබුණත් ඒ සියල්ලෝම සංඝරාජයන් වහන්සේගේ පාලනයට හා නායකත්වයට කීකරු වෙති. උදාහරණයක් ලෙස තායිලන්තයේ මෑත කාලීනව බිහි වූ ධම්මකාය භික්ෂු සම්ප්‍රදාය එරට පැවති සාම්ප්‍රදායික භික්ෂු සංස්ථාවෙන් වෙනස් වූවකි. එනිසාම ඇතම්විට සාම්ප්‍රදායික භික්ෂූන්ගේ විරෝධයද එම සම්ප්‍රදායට එල්ලවී ඇත. එහෙත් එම සම්ප්‍රදාය විසින් ද සංඝරාජයන්ගේ නායකත්වය පිළිගනී. එයට හේතුව උන්වහන්සේගේ නිර්දේශයෙන් තොරව භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කිරීම ආදි කටයුතු කළ නොහැකි බැවිනි. එසේම භික්ෂූන් සම්බන්ධයෙන් ඇතිවන ගැටලුවලදී සංඝරාජයන් වහන්සේ මැදිහත්වීමක් සිදු කරන අතර රාජ්‍ය තාන්ත්‍රික වශයෙන්

විශාල බලපෑමක් උන්වහන්සේට කළ හැකිය. භික්ෂූන් වහන්සේලා විසින් සිදු කරන විනය විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙනමම යාන්ත්‍රණයක් තායිලන්තයේ ඇති බව පැවසේ.[8]

එහෙත් වර්තමාන ලංකාවේ ශාසනික ගැටලු වෙනුවෙන් පොදුවේ වගකියන භික්ෂු නායත්වයක් හෝ ක්‍රමවේදයක් නොමැති වීම විශාල අඩුපාඩුවක් වශයෙන් බොහෝ අවස්ථාවන්වල දී පෙනී යන්නකි. ඇතැම්විට ශාසනික ගැටලු ඇති වූ අවස්ථාවල දී නිකාය හා පාර්ශ්වවල භික්ෂූන් වහන්සේලා එකතු වී සාකච්ඡා කළ ද බොහෝ සාකච්ඡා එකගතාවකින් තොරව අවසන් වී යන අයුරු පෙනේ. එයට එක් හේතුවක් වන්නේ ඒ ඒ නිකායයන් සඳහා වෙන වෙනම කතිකාවත් හා සම්ප්‍රදායයන් පැවතීමයි. මෑතක වැඩි කතාබහට ලක් වූ පොදු භික්ෂු කතිකාවත සම්පාදනය එවැන්නකි. මෙසේ විවිධ අදහස් දැරීම තුළින් සිදුවන්නේ ශාසනික ගැටලු විසඳගැනීම සඳහා ඇති වටිනා අවස්ථා ගිලිහීයාමයි. එබැවින් සමස්ත භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පෙනී සිටිය හැකි කිසියම් පොදු යාන්ත්‍රණයක් ගොඩනැගීම කාලෝචිත බව පෙනේ. මෙම සාකච්ඡාව තුළින් සියලු නිකායවල සහ පාර්ශ්වවල සිටින භික්ෂු නායකත්වය වෙනුවට සංඝරාජ කෙනෙක් පත්කිරීම සඳහා යෝජනා කිරීමට අපේක්ෂා නොකෙරේ. එහෙත් පවත්නා පසුබිම තුළින් ශාසනික ගැටලු සාකච්ඡා කිරීම සඳහා කිසියම් ක්‍රමවේදයක් සැකසිය හැකිය. ශ්‍රී ලාංකේය භික්ෂු සංස්ථාව පොදුවේ නියෝජනය කරන්නේ එකම ථෙරවාද සම්ප්‍රදාය බැවින් ධර්ම විනය සම්බන්ධයෙන් ගැටලුවක් මෙම සම්ප්‍රදායයන් තුළින් මතු වී නොමැත. ප්‍රාදේශීය වශයෙන් ශාසනික කටයුතු කිරීමේදී නිකාය හෝ පාර්ශ්ව භේදයකින් තොරව එකට කටයුතු කිරීම නිබඳව දැක ගත හැකිය. මෙම නිකායන් තුළ පවතින්නේ සාම්ප්‍රදායික වෙනස්කම් කිහිපයක් පමණි. පොදු මතවාදයකට පැමිණීම සඳහා කිසිදු ගැටලුවක් මෙහි ඇති බවක් නොපෙනේ. ශාසනික ගැටලු විසඳා ගැනීම සඳහා එකට එකතු වී විසඳුම් සෙවීමකින් තොරව වෙනත් විකල්පයක් නොමැති බව පෙනේ.

වර්තමානය වන විට භික්ෂූන් වහන්සේලා තුළ පැවති

ශාසනික සාම්ප්‍රදාය පිළිබඳ දැනුම් පද්ධති ක්‍රමයෙන් නැතිවී යන ස්වරූපයක් දැකිය හැකිය. භික්ෂුව සතුව තිබූ ශික්ෂණයද විචක්ෂණශීලිත්වය ද සමාජ නායකත්වය ද ගිළිහී යමින් පවතී. සරල ලෙස දක්වන්නේ නම් ධර්ම විනය පිළබඳ මනා දැනුමක් ඇති භික්ෂූන් වහන්සේලා නිර්මාණය කිරීම කෙරෙහි කිසිවෙකුගේ අවධානයක් යොමු වී නොමැත. ලාංකීය සමාජය තුළ නායකත්වය මහණකමත් සමගම භික්ෂුවට උරුමවන්නකි. මහින්දාගමනයෙන් පසු ලාංකීය ශිෂ්ටාචාරය ගොඩනැගුනේ පංසල කේන්ද්‍ර කරගෙන බැවින් භික්ෂුව නිරායාසයෙන් ප්‍රධානත්වයට පත් විය. එකල ගමේ සිටි දැන උගත් පුද්ගලයා වූයේ භික්ෂූන් වහන්සේය. එයට හේතුව භික්ෂුව එකල සමාජයට සාපේක්ෂව නිසි අධ්‍යාපනයක් ලබා තිබීමයි. එසේම අනුරාධපුර යුගයේ මහාවිහාරය මුල් කර ගෙන ආරම්භ වූ භික්ෂු අධ්‍යාපන සම්ප්‍රදාය පසුව මූලායතන නාමයෙන් ව්‍යාප්තවී ගිය අයුරුත් මූලායතන තුළින් විශිෂ්ට ගණයේ භික්ෂූන් වහන්සේලා බිහි වූ අයුරුත් උන්වහන්සේලා විසින් සිදු කළ ධර්ම ශාස්ත්‍රීය සේවාව කෝට්ටේ යුගය දක්වාම උසස් මට්ටමින් පැවති අයුරුත් පැහැදිලි වේ.[9] මහනුවර යුගය වන විට බිඳ වැටුණු මෙම අධ්‍යාපන සම්ප්‍රදාය වැලිවිට සරණංකර සංඝරාජයන් විසින් නැවතත් ගොඩ නැගූ අයුරු ප්‍රකයට. වර්තමාන භික්ෂු අධ්‍යාපනයට පසුබිම සැකසෙන්නේ විද්‍යෝදය හා විද්‍යාලංකාරය යන පිරිවෙන් මුල් කර ගෙනය. මුල් යුගයේ මෙම ආයතන කේන්ද්‍රකරගෙන බිහි වූ විශිෂ්ඨ ගණයේ භික්ෂූන් වහන්සේලා රාශියක් ලංකාවේ වැඩ සිටියහ.

එසේම පසුගිය සියවස් කිහිපය තුළ යුරෝපීය ආක්‍රමණ නිසා ලංකාවේ සිදු වූ දේශපාලන විපර්යාස තුළින් සාම්ප්‍රදායික භික්ෂු අධ්‍යාපනය මෙන්ම භික්ෂු චර්යාවන් ද වෙනස් වූ අයුරු පෙනේ. ගෝලීයකරණය තුළ ගිහි සමාජය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන විට එයට සාපේක්ෂව භික්ෂු ආකල්ප රැකගෙන පවතින සමාජ තත්වයට අනුව සිය ගමන්මග සකස් කර ගැනීමට වර්තමාන භික්ෂුවට හැකියාවක් ලැබී තිබෙන බවක් නොපෙනේ. එසේම වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ක්‍රමවේදය තුළ යුගයට අවශ්‍ය ධර්ම හා විනය තුළින් ශික්ෂණයක් ලැබූ භික්ෂූන් වහන්සේලා බිහිවීමට

අවශ්‍ය පදනම වැටී තිබේ දැයි නැවත ප්‍රශ්න කළ යුතුය. එසේ නොමැති නම් එය නිවැරිදි තැනට ගෙන ඒමට ශාසන භාරකාර ස්වාමින් වහන්සේලා සැලකිය යුතු මැදිහත්වීමක් සිදු කර තිබේද යන්න ද ප්‍රශ්නයකි. වර්තමාන ශාසනික ධූරාවලීන් නිර්මාණය වී තිබෙන ආකාරය අනුව විහාරාධිපති තනතුරේ සිට මහානායක පදවි දක්වා ශාසනික තනතුරු භාර ගැනීමට සුදුසු භික්ෂූන් වහන්සේලා නිර්මාණය කිරීමේ වගකීම නූතන වැඩිහිටි භික්ෂූන් වහන්සේලා සතු මගහැරිය නොහැකි වගකීමකි. සෙසු ආගමික සම්ප්‍රදායයන් මගින් සිය දහම පවත්වාගෙන යාමට අවශ්‍ය පූජකවරු විධිමත් පරිදි නිර්මාණය කරති. ඒ සඳහා වෙනමම යාන්ත්‍රණයක් ඒ ඒ ආගම් තුළ සැකසී තිබේ.[10] එහෙත් ලංකික භික්ෂු සංස්ථාව තුළ එවැනි නිශ්චිත වැඩ පිළිවෙළක් ඇති බවක් නොපෙනේ. දඹදෙණි කතිකාවත අධ්‍යයනය කිරීමෙන් එකල පැවති භික්ෂු නායකත්වයේ ධූරාවළිය සහ ඒ සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම් විමසීමේදී එම යුගය වන විටත් ලක්දිව භික්ෂූන් වහන්සේලා තුළ පැවති විධිමත් අධ්‍යාපනය සහ සංවිධිත භාවය මැනවින් ප්‍රකට වේ. ගණදෙටු තනතුරේ සිට මහාසාමි දක්වා තනතුරුවලට පත්කිරීමේදී ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය. මහාසාමි පත්කරන්නේ මහාථෙර තනතුරු දෙකෙන් එක් අයෙක් ගෙනි. මහාථෙර තනතුරු දෙකක් පැවතියේ එකල පැවති ග්‍රාමවාසී හා වන වාසී සම්ප්‍රදායයන් දෙක නියෝජනය වන පරිදිය. ඒ සඳහා සුදුසුකම් ලෙස දක්වා තිබෙන්නේ ප්‍රාතිමෝක්ෂ සංවරශීලාදිය කඩ නොකර රැකගැනීම, අටුවා සහිත ත්‍රිපිටකය ගැඹුරට දැනීම, පරෝපදේශ ගුණය, ආදර්ශවත් චරිතයක් ඇතිවීම, උපසපන් වී විසි වස් පිරීම යන සුදුසුකම්ය. අනතුරුව තිබූ උසස් තනතුර වූයේ මූළායතනාධිපති තනතුරයි. එනම් අෂ්ට මූළායතනයන් හි අධිපති තනතුරුය. මෙම තනතුරුවලට පත්කිරීමේදී ද සංඝ සම්මුතිය හා රාජ සම්මුතිය තිබීම ද මහාසාමිගේ කැමැත්ත ද තිබිය යුතු බව දැක් වේ. මීට පහළ තනතුර වනුයේ පිරිවෙන්පති තනතුරයි. එම තනතුරට පත් කිරීමේ දී ද චරිතවත් බව, සාම්ප්‍රදායික සිරිත් විරිත් පිළිබඳ අවබෝධය, හික්මවීමෙහි දක්ෂබව ආදී ලක්ෂණ පරීක්ෂා කර බලා සංඝයාගේ, මහාසාමිගේ හා රජුගේ කැමැත්ත ද ඇතිව සිදු කර තිබේ. ධූරාවලියේ පහළම ස්ථරය වන්නේ ගණ දෙටු පදවිය

ද එසේය.[11] එහෙත් වර්තමානයේ ශාසනික තනතුරු ප්‍රධානයේදී නිශ්චිත ක්‍රමවේදයක් ඇති බවක් ඇතැම් විට නොපෙනේ.

සෑම භික්ෂූන් වහන්සේ නමකටම ධර්ම විනය පිළිබඳ මනා දැනුමක් තිබීම අත්‍යවශ්‍යය. එසේම සංඝ සංස්ථාව තුළ තනතුරුවලට පත්වන්නේ නම් විශේෂයෙන් ත්‍රිපිටකය පිළිබඳ හසල දැනුමක්ද තිබිය යුතුය. එම දැනුම නිරායාසයෙන් භික්ෂුව තුළ ඇතිවන්නක් නොවන අතර නිසි අධ්‍යාපන ක්‍රමයකින් ගොඩ නැගිය යුත්තකි. වර්තමාන ලංකාවේ පිරිවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළින් භික්ෂුවකට අවශ්‍ය ධර්ම-විනය දැනුම ප්‍රමාණවත්ව නොලැබෙන බව පෙනේ. එබැවින් මෙම ගැලුව නිසි පරිදි නොවිසඳීම නිසා අනාගතයේ ත්‍රිපිටකය හා ශාසනික සම්ප්‍රදායයන් පිළිබඳ නිසි දැනුමක් නැති භික්ෂූන් වහන්සේලා බිහිවීම තුළින් භික්ෂු නායකත්වය මෙන්ම ශාසනය ද පිරිහීමට පත්වීම වැළක්විය නොහැකිය.

වර්තමාන ලංකාවේ භික්ෂු සංස්ථාව තුළ පවත්නා තවත් ගැටලුවක් නම් භික්ෂු දේශපාලනය සම්බන්ධයෙන් එකගතාවක් නොමැතිකමයි. ලක්දිව බුදුදහම ක්‍රියාත්මක වූ ආකාරය දෙස බලන විට පෙනී යන්නේ මහින්දාගමයේ පටන්ම රජය හා භික්ෂූන් වහන්සේ අතර පැවතියේ අසීමිත බැඳීමකි. ලංකාවට බුදුදහම පැමිණෙන්නේ ද රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් පැවති සම්බන්ධතාවක් තුළිනි. මිහිඳු මහරහතන් වහන්සේගේ සිට සෑම යුගයකම වැඩ සිටි භික්ෂූන් වහන්සේලා ඒ ඒ යුගවල පැවති දේශපාලනය සමග දැඩි සම්බන්ධතා පැවැත් වූ අයරු වංශකථා තුළින් තහවුරු වේ. ශාසනය තුළ ගැටලු මතු වන විට රජවරු ද රාජ්‍යත්වය තුළ අර්බුද හටගන්නා විට භික්ෂූන් වහන්සේලා ද මැදිහත් වූ අයුරු ඉතිහාසය තුළින් පැහැදිලි වේ.[12] යුරෝපීයයන් මෙරට ආක්‍රමණය කළ යුගයේ එයට එරෙහිව රජය සමග එකතු වී ජනතාව පෙළගැස්වීමට භික්ෂූන් සුවිශාල කාර්යභාරයක් ඉටු කළ බව නොරහසකි. එනම් භික්ෂුව හා දේශපාලය අතර සම්බන්ධතා මෑත කාලීනව ඇති වූ ප්‍රවණතාවක් නොවේ.

බුදුසසුනේ දියුණුව රඳා පැවතියේ රජුගේ අනුග්‍රහය

මතය. රාජ්‍ය අනුග්‍රහය නොමැති වූ විට සසුන පිරිහී ගිය අයුරු ඉතිහාසය පුරාම දැකගත හැකි වේ. එබැවින් ශ්‍රද්ධාවන්ත රජවරු නිරන්තරයෙන් බුදුදහමේ දියුණුවට කටයුතු කළ ආකාරය ඉතා ප්‍රකටය. සසුන පිරිහුණු අවස්ථාවන්වලදී කතිකාවත් ඇතිකර නැවතත් එය නගාසිටුවීමට ලක් රජවරු කටයුතු කළ අයුරු පොළොන්නරු, දඹදෙණි වැනි කතිකාවත් තුළින් පෙනීයයි. එබැවින් ලාංකීය සංදර්භය තුළ භික්ෂුවට දේශපාලන සම්බන්ධතාවලින් වියුක්තව කටයුතු කළ නොහැකිය. නමුත් වත්මන් දේශපාලන පසුබිම රජ දවසට වඩා අතිශයින්ම වෙනස් යැයි කිවහොත් එය නිවැරදිය. දේශපාලය යනු බල අරගලයකි. වත්මන් පක්ෂ දේශපාලනය රටාව තුළ අධික තරගකාරිත්වයක් නිර්මාණය වී ඇත. දේශපාලඥයින් බලය වෙනුවෙන් ආගම, ජාතිකත්වය ඇතුලු ඕනෑම සංවේදී කරුණක් යොදා ගනී. එබැවින් පවතින දේශපාලන රටාව තේරුම් ගෙන කටයුතු කිරීම භික්ෂුවගේ අනිවාර්ය වගකීම වේ. රාජ්‍ය පාලන ක්‍රමවේදය රටටත් ජනතාවටත් අහිතකර වන විට එය නිවැරදි කිරීම ශ්‍රී ලාංකේය භික්ෂුවට උරුම වූ ඓතිහාසික වගකීමකි.[13] මෙහිදී දේශපාලනය යනු වර්තමානයේ පවත්නා පක්ෂ දේශපාලයයැයි වරදවා තේරුම්ගත යුතු නැත. මෙය වරදවා තේරුම් ගන්නා බොහෝ දෙනෙක් දේශපාලකයන්ට දේශපාලනය කිරීමට ඉඩ දී භික්ෂූන් වහන්සේලා ශාසනික කටයුතු ඉටුකරමින් සිටියු යුතුයැයි විශ්වාවස කරති. එහෙත් කිසිවෙකුට දේශපාලනය නොවැදගත්යැයි බැහැර කර සිටිය නොහැකිය. මන්ද දේශපාලනය යනු ජීවිතය පිළිබඳ ප්‍රශ්නයකි. රටක පුද්ගලයා හා සම්බන්ධයෙන් සියලු දේ තීරණය කරන්නේ දේශපාලනයයි. එබැවින් දේශපාලනයට සම්බන්ධ නොවී රටක ජීවත් විය නොහැකිය. රටේ දේශපාලන ස්ථාවරභාවයක් නොමැති නම් ආගමික සංවර්ධයක් කිසිසේත්ම සිදු නොවේ. බුදුරදුන් පවා පවත්නා දේශපාලන රටාව පිළිබඳ සංවේදීව කටයුතු කළ අයුරු දැක ගත හැකිය. දේශපාලනය නිවැරිදි මාවතකට ගෙන ඒම සඳහා දේශපාලන මූලධර්ම සමූහයක් හඳුන්වා දී තිබීමෙන් කිසියම් දේශපාලන මැදිහත් වීමක් සිදු කර ඇත. එසේම බුදුරදුන් හා එකල සිටි රජවරුන් අතර දැඩි සම්බන්ධතාවක් පැවති බවට ත්‍රිපිටකයේ බොහෝ සාධක ඇත.[14]

එහෙත් වර්තමානයේ භික්ෂුව හා දේශපාලනය අතර පවත්නා සම්බන්ධතා දෙස බැලීමෙන් පැහැදිලි වන කරුණක් නම් භික්ෂූන් වහන්සේ පවත්නා දේශපාලන ප්‍රවාහය තුළ අතරමංවී ඇති බවයි. දේශපාලඥයින්ගේ කූට උපායයන්වලට භික්ෂුව හසුවී ඇති ස්වරූපයක් පෙනෙන්නට තිබේ. ඉහළ සිට පහළ දක්වා භික්ෂූන් වහන්සේලා දේශපාලනය සමග සිදු කරන ගනු දෙනු තුළින් එය මැනවින් පිළිබිඹු වේ. භික්ෂූන් වහන්සේලා තුළ පවත්නා සංකීර්ණ දේශපාලන රටාව පිළිබඳව ඇති අනවබෝධය මේ සඳහා හේතු වී ඇති බව පෙනේ. ආගම ගැන හෝ ජාතිය ගැන පක්ෂව කරුණක් ප්‍රකාශ කිරීමෙන්ම දේශපාලකයා ජාතිමාමක හෝ ආගම කෙරෙහි ලැදියාවක් ඇත්තෙක්දැයි තීරණය කළ නොහැක. අවස්ථාවාදී දේශපාලඥයින් භික්ෂූන් වහන්සේලා තුළ පවත්නා මෙම දුර්වලතාව තේරුම් ගෙන එයින් උපරිම ප්‍රයෝජන ගන්නා අයුරු මැනවින් පැහැදිලිය. ඇතැම් විට විහාරස්ථානවල ආගමික උත්සව දේශපාලන රැස්වීම් බවට පත් වන අවස්ථාද දැකිය හැකිය.

කුමන පදවියක් දැරුවත් භික්ෂුවට සිය භික්ෂුත්වය අමතක කර කටයුතු කළ හැකි නොවේ. සංඝ සංස්ථාවේ ආරම්භයේදීම බුදුරදුන් භික්ෂූන් වහන්සේලාට ලබාදුන් උපදේශය වූයේ බහුජන හිත සුව පිණිස කටයුතු කළ යුතුය යන්නය. එම අවවාදයේ භික්ෂූන් වහන්සේලා පිහිටා කටයුතු කළ බව ඉතිහාසය පුරාවටම දැක ගත හැකිය. විසිවැනි සියවසේ මැදභාගයේ ලංකාවේ සිදු වූ දේශපාලන පෙරළියට නායකත්වය ලබාදුන්නේ භික්ෂූන් වහන්සේලාය. ඒ සඳහා දායකත්වය ලබා දුන් භික්ෂූන් අතර එවකට වැඩසිටි උඩකැන්දවල සරණංකර හිමි, වල්පොළ රාහුල හිමි, බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි වැනි ප්‍රකට භික්ෂූන් වහන්සේලා ද විය. මෙම යුගයේ භික්ෂු දේශපාලය සම්බන්ධයෙන් දැඩි විරෝධතාවක් මතු වූ හෙයින් විද්‍යාලංකාරය මගින් භික්ෂුවගේ දේශපාලය අර්ථකථනය කර ලේඛනයක් සකස් කළේය. එහි භික්ෂුවගේ මූලික පරමාර්ථවලින් ගිළිහී නොගොස් පවතින දේශපාලන දහරාව සමග කටයුතු කළ යුත්තේ කෙසේ දැයි දක්වා ඇත.[15] එම ''විද්‍යාලංකාර ප්‍රකාශය'' ලාංකික භික්ෂු දේශපාලනයේ සංධිස්ථාන වශයෙන් දැක්විය හැකිය.

ලංකාවේ නීතියට අනුව භික්ෂුවට ඡන්ද බලය ලැබී ඇති බැවින් භික්ෂුවට රටේ පුරවැසියෙකු වශයෙන් කිසියම් දේශපාලන පක්ෂායයකට ඡන්දය ලබා දිය හැකිය. එහෙත් මෙහි දී භික්ෂූන් වහන්සේලා ප්‍රවේසම් විය යුත්තේ බොහෝ දේශපාල පක්ෂ නියෝජනය කරන පිරිස් සිය දායක ගම්වල වෙසෙන බැවිනි. එබැවින් මැදමාවතක සිට කටයුතු කිරීම සෑම අතින්ම යහපත්ය. භික්ෂූන් වහන්සේ නමක් දේශපාලනය සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්නේ නම් ඒ මතය පිළිබඳව නැවත නැවතත් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් පසුව සිදු කළ යුත්තකි. ඇතැම් විට දේශපාලන හිතවත්කම් මත හෝ දේශපාලකයින් විසින් නොමග යැවීමෙන් ඇතැම් භික්ෂූන් විසින් කරන ප්‍රකාශන සමස්ත භික්ෂු සංස්ථාවම අපහසුතාවට පත්වන අවස්ථා ඇත. බොහෝ විට එවැනි භික්ෂූන්ගේ අව්‍යක්ත ප්‍රකාශ සමාජයේ උපහාසයට ලක්වීම වැලැක් විය නොහැකිය.

වර්තමානයේ ලංකාවේ ක්‍රියාත්මක වන දේශපාලනය සංස්කෘතිය අතිශයින්ම ප්‍රාථමික තත්ත්වයට පත් වී ඇති බව නොරහසකි. එවන් පසුබිමක් තුළ භික්ෂූත්වයේ ගරුත්වය රැකගෙන දේශපාලනය කිරීම කිසිසේත්ම කළ නොහැක්කකි. පාර්ලිමේන්තුවේ සිට ප්‍රාදේශීය සභාව දක්වා භික්ෂූන් වහන්සේලා මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කරති. එහෙත් දේශපාලනයට පිවිසීමෙන් භික්ෂු සමාජය තවදුරටත් පරිහානියට පත් වූවා මිස ලබාගත් විශේෂ ජයග්‍රහණයක් නොමැත. එබැවින් භික්ෂු දේශපාලනය පිළිබඳ කතිකාවතක් පොදුවේ ඇති කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ යුත්තේ නිකාය හා පාර්ශ්වවල ප්‍රධාන ස්වාමීන් වහන්සේලාය.

මෑත කාලයේ භික්ෂු සංස්ථාව තුළ මතු වූ නව ප්‍රවණතාවක් නම් ජාතිකත්වය හෝ ආගම මුල් කරගෙන සිවිල් සංවිධාන පිහිටුවාගෙන ඒ තුළින් ආගමික හා ජාතික හැඟීම් මතු කරලීමට උත්සාහ කිරීමයි. එම සංවිධානවල භික්ෂු නියෝජිතයින් මතු කරන කාරණා සත්‍ය වුවත් ඒවායේ ක්‍රියාකාරිත්වය දෙස බැලීමේදී බොහෝ විට පෙනී යන්නේ ප්‍රබුද්ධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වනවා වෙනුවට භික්ෂූත්වයට නොගැළපෙන ඕලාරික ස්වරූපයක්

ගෙන ඇති බවයි. එසේම ජාතීන් අතර වෛරය, ද්වේශය ඇතිවීමට මෙම සංවිධානවල ක්‍රියාකාරිත්වයන් හේතු වී ඇත. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ලාංකේය භික්ෂු ප්‍රතිරූපයට මෙම සංවිධාන තුළින් සැලකිය යුතු මට්ටමේ හානියක් සිදු වී ඇත. මෙම සංවිධානවල ක්‍රියාකාරීත්වයන් නියාමනය කිරීම සඳහා කිසිදු නිකායක් ඉදිරිපත් වන්නේ නැත.

භික්ෂූන් දේශපාලනයට පිවිසීම හා විවිධ සංවිධාන ගොඩනගා ගැනීමට බල පෑ එක් මූලික හේතුවක් වූයේ ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාවට හා භික්ෂු සංස්ථාවට එල්ල වී ඇති අභියෝගයන්ය. වගකිව යුතු භික්ෂූන් වහන්සේලා මෙම අභියෝග හා ගැටලු මූලිකවම හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදීමට කටයුතු කළේ නම් බොහෝ ගැටලු ආරම්භයේ දීම විසඳ ගැනීමට හැකියාව ලැබෙන අතරම ඉහත සඳහන් කළ විකල්ප කරා සෙසු භික්ෂූන්ට පිවිසීමට අවශ්‍යතාවක් ද උදා නොවනු ඇත. එහෙත් එවැනි ප්‍රශ්න සඳහා කිසිවෙක් ඍජුව මැදිහත් වීමක් බොහෝ විට දකින්නට නොලැබේ. ඒ සඳහා ඇති එක් ගැටලුවක් වන්නේ එවැනි අවස්ථාවකදී මූලිකත්වය ගෙන කටයුතු කළ යුත්තේ කුමන නිකාය හෝ පාර්ශ්වයදැයි කිසිවෙකු නොදන්නා බැවිනි.

වර්තමාන ලංකාවේ බුදුසසුන සම්බන්ධයෙන් මතු වී තිබෙන තවත් ප්‍රධාන ගැටලුවක් නම් විවිධ පුද්ගලයින් විසින් සිය අභිමතය පරිදි ධර්මය විනය අර්ථකථනය කිරීම, ත්‍රිපිටකය පරිවර්තනය කිරීම හා විවිධ නව සම්ප්‍රදායයන් ඇතිකර ගැනීමයි. මෙම ගැටලුව මතුවන්නේ බොහෝ සෙයින්ම සසුන තුළින්මය.[16] ඇතැම් භික්ෂූන් තමන් මාර්ගඵලලාභීන් වශයෙන් මෙන්ම රහත්, බුද්ධ වශයෙන් බෞද්ධ සම්ප්‍රදාය තුළ ඉමහත් ගෞරවයෙන් සලකන ආධ්‍යාත්මික තත්වයන් තමන් වෙත ආරෝපණය කරගෙන සිය රුචිය මත බුදුදහම පැහැදිලි කරමින් ජනතාව නොමග යවමින් සිටිති. ඇතැම් භික්ෂූන් පවත්නා ශාසනික සම්ප්‍රදායයන් විවේචනය කරමින් නව සම්ප්‍රදායයන් බිහිකරගෙන ඇත. බුදුසසුනේ මුල් යුගයේ සිටම මෙම ගැටලුව පැවතුනි. ලංකා ඉතිහාසය විමසීමෙන් විවිධ අවස්ථාවන්හි ථෙරවාද සම්ප්‍රදායට අයත් ධර්මය විකෘති කරන භික්ෂූන්ට එරෙහිව විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. ද්විතීය

හා තෘතීය ධර්ම සංගායනා තුළ දී ථෙරවාද භික්ෂූන් සිය සම්ප්‍රදාය වෙනස් කරමින් විවිධ සංශෝධන හා අර්ථකථන ගෙන ඒමට දැරූ පිරිස් රාජ්‍ය බලය ද යොදා ගනිමින් සාර්ථකව මැඩ පැවැත් වූ අයුරු ඓතිහාසික සාධක තුළින් තහවුරු වේ.[17] ලංකාව තුළ දී ද අනුරාධපුර යුගයේ අභගිරි, ජේතවන වැනි සම්ප්‍රදායයන් මගින් ථෙරවාද නොවන වෙනත් බෞද්ධ සම්ප්‍රදායයන්ගේ අදහස් පිළිගත් විට මහාවිහාර භික්ෂූහු ඒවා මැඩපැවැත්වීමට කටයුතු කළහ. ක්‍රි.ව. 269 දී රජ පැමිණි වෝහාරිකතිස්ස රාජ්‍ය සමයේ පැමිණි වෛතුල්‍යවාද මතය බැහැර කිරීම එක් නිදසුනකි. පොළොන්නරු සමයේ මහපැරකුම්බාවන් සිදු කළ ශාසන ශෝධනයේ දී ද සැබැවින්ම සිදුවූයේ ථෙරවාද මතයට විරුද්ධ අදහස් දැරූ මතවාදීන් සසුනෙන් ඉවත් කිරීමය.[18]

එසේම අතීතයේ භික්ෂූන්ට සිය රුචිය පරිදි ධර්ම දේශනා කිරීම සඳහා අවකාශ ලැබී නොමැත. ''සම්මතයක් ලද තෙනක්මුත් ඒ ඒ තෙන අසම්මත වැ බණ නොකිය යුතු.'' යනුවෙන් දඹදෙණි කතිකාවතෙහි දක්වා තිබේ.[19] වර්තමානයේ බුරුමයේ ප්‍රසිද්ධියේ ධර්ම දේශනාවක් සිදු කළ හැක්කේ ඒ සඳහා සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන භික්ෂූන්ට පමණි. එහෙත් වර්තමාන ලංකාවේ කිසිදු ගුණාත්මකභාවයක් නොමැතිව කවි, සිංදු ගායනා කරමින් අතිශය ඕලාරික ස්වරූපයෙන් ධර්මය දේශනා කරන භික්ෂූන් වහන්සේලා බිහි වී ඇත. ඇතැම් ජනමාධ්‍ය ආයතන ජනප්‍රියත්වය නිසාම එවැනි භික්ෂූන් සඳහා වැඩි ප්‍රචාරයක් ලබා දෙනු පෙනේ. එසේම බොහෝ භික්ෂූන් ධර්මය දේශනා කරන්නේ බුදුරදුන් අනුදත් ලෙස බහුජන හිත පිණිස නොවේ. මෙවැනි තත්ත්වයන් පාලනය කිරීමට හෝ වෙනස් කිරීමට වගකියයුතු කිසිවෙක් ඉදිරිපත් නොවීම ඛේදනීය තත්වයකි. රට තුළ ප්‍රධාන නිකායයන් තුනක් ඇත. රජය වෙනුවෙන් මැදිහත්වීම සඳහා බුද්ධශාසාසන අමාත්‍යංශයක් ද අමාත්‍යවරයෙක් හා කොමසාරිස්වරයෙක් ද සිටී. අවශ්‍ය වන්නේ නිවැරුදි වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීමයි. රාජ්‍ය මැදිහත්වීමක් ලබා ගැනීමට අවශ්‍ය නම් එය අපහසු නොවේ. එහෙත් එවැනි වැඩපිළිවෙළක් පිළිබඳ පැහැදිලි කතිකාවක් පෙනෙන්නට නොමැත. ඇතැම් අවස්ථාවන්වලදී යම් යම් ක්‍රියාමාර්ග ආරම්භ

කරන බව පෙනීගියත් නිශ්චිත අවසානයක් නොමැතිව අතර මග නතර වන ස්වරූපයක් පෙනේ.

උසස් අධ්‍යාපනයේ නියුතු ඇතැම් භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් දෙස බලන විට පෙනී යන්නේ භික්ෂුව විසින් පිළිපැදිය යුතු විනය නීති රීති විශ්වවිද්‍යාල සීමාවන් තුළට අදාළ නොවන ස්වරූපයකි. තායිලන්තය, බුරුමය වැනි ථෙරවාද රටවලද භික්ෂූන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යොමු වුවත් එම රටවල භික්ෂූන් තුළින් මෙවැනි ස්වරූපයක් දැක ගත නොහැකිය. විශ්වවිද්‍යාල දැනුම සඳහා තෝතැන්නක් වුවත් එහි පවත්නා අසීමිත නිදහස නිසා බොහෝ තරුණ භික්ෂූන් වහන්සේලා භික්ෂූත්වයට නොගැළපෙන ක්‍රියාවන්හි නිරත වනු පෙනේ. මෙම තරුණ භික්ෂූන් වහන්සේලා රැක ගැනීම සැමගේ වගක්මක් නොවන්නේද?

තවද ලාංකික භික්ෂු සමාජය තුළ ගරු-සිසු සබඳතා විධිමත් පරිදි නොපැවතීම තවත් ගැටලුවකි. බොහෝවිට ආගමික අවශ්‍යතා සපුරගනු වස් සසුන් ගත කරන ඇතැම් භික්ෂූන් වහන්සේලාට විධිමත් පරිදි අධ්‍යාපනයක් හෝ භික්ෂුවකට අවශ්‍ය මූලික ශික්ෂණයක් හෝ නිසි පරිදි නොලැබීම හේතු කොට ගෙන ඔවුන් ශාසනික ප්‍රතිපත්ති තුළින් ගිළිහී ස්වාධීනව කටයුතු කරන පිරිසක් බවට පත්ව ඇත. සසුන තුළ ආචාර්ය හා උපාධ්‍යාය වශයෙන් තනතුරු දෙකක් නිර්මාණය වී තිබෙන්නේ භික්ෂුවක් පැවිදි හෝ උපසම්පදා කිරීමෙන් අනතුරුව තවදුරටත් වර්ධනය කරගත යුතු ශික්ෂණයක් ඇති නිසාය. කුල දරුවන් පැවිදි හා උපසම්පදා කරන ඇතැම් වැඩිහිටි භික්ෂූන්ට මෙම තනතුරුවල භාවිතයන් පිළිබඳව හෝ හරියාකාර අවබෝධයක් නොමැති බව පෙනේ. කුලදරුවෙකු සසුන්ගත කරන්නේ නම් ඔවුන් පිළිබඳව පූර්ණ වගකීමක් එම දරුවා සසුන්ගත කරන භික්ෂුව විසින් දැරිය යුතුය. එම වගකීම පැවිදි කළ අවස්ථාවේ සිට අදාළ ආචාර්යවරයා විසින් දැරිය යුතු බරපතල වගකීමක් බව දඹදෙණි කතිකාවතෙහි සඳහන් වේ.[20] කිසියම් ගැටලුවක් ඇති වූ විට නීත්‍යානුකූලව සිය ගෝලකමින් ඉවත් කළ පමණින් සිය වගකීමෙන් නිදහස් වීමට ගුරුහිමියන්ට නොහැකිය.

ලාංකේය ශාසන ඉතිහාසය දෙස බලන විට අනුරාධපුර යුගය හැරුණු විට පොළොන්නරු යුගයේ සිට මහනුවර යුගය දක්වා රාජ්‍ය කාලසීමාවන් තුළ භික්ෂු කතිකාවත් සම්පාදනය කර ඇත. සමස්තයක් ලෙස බලන විට ඒවා තුළින් පෙනීයන්නේ භික්ෂු චර්යාවන් ශාසන විධි නියමයන් ඉක්මවා යන අවස්ථාවන්වලදී කිසියම් දුරකට පාලනය කිරීමට ගත් උත්සාහයකි. මහනුවර යුගයෙන් පසු විටින් විට නිකායයන් මගින් ව්‍යවස්ථාවන් හා කතිකාවත් සම්පාදනය කළත් සමස්ත ලාංකේය භික්ෂු සංස්ථාවම අරබයා කිසිදු විධිමත් කතිකාවතක් සම්පාදනය වී නොමැත. ඉහත දක්වන ලද කරුණුවලින් පැහැදිලි වන්නේ විධිමත් කතිකාවතක් ඇති කිරීම කාලෝචිත බවයි. මෑත කාලයේ භික්ෂු කතිකාවතක් සකස් කර එය සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුව දක්වා පැමිණියේය. ඒ සම්බන්ධයෙන් විවිධ මතවාදයන් රටේ භික්ෂූන් වහන්සේලා අතර මෙන්ම ගිහි ප්‍රජාව අතර ද මතු විය. එහෙත් ඒ සම්බන්ධයෙන් භික්ෂු මූලස්ථානවලින් ඍජු ප්‍රතිචාර දක්වා නැත. මේ සම්බන්ධයෙන් ඍජුව වග කියන කිසිවෙක් නොමැති බැවින් බොහෝ දෙනෙකු මුනි වත රකින ස්වරූපයක් පෙනේ. එහෙත් මෙය ලාංකීය ශාසනය සඳහා එතරම් හිතකර ස්වරූපයක් නොවන බව කිව යුතුය. භික්ෂුව හා ශාසනය යම් යම් අභියෝගවලට පත්ව ඇති මොහොතක වගකිවයුත්තන් නිහඬව සිටීම පිළිබඳව බොහෝ දෙනෙකුට ඇත්තේ දැඩි විමතියකි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කිරීම කල් නොයවා කළ යුත්තකි.

## සමෝදානය

ඉහත සඳහන් කළ කරුණු එකිනෙක විමසීමෙන් පෙනීයන්නේ ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය තුළ අභියෝග රැසක් නිර්මාණය වී ඇති ආකාරයයි. මෙම අභියෝගවලින් බහුතරයක් ශාසනය තුළින්ම ඇතිවී තිබෙන බව පෙනේ. එහෙත් සාමූහිකත්වය තුළින් මෙකී සියලු ගැටලු නිරාකරණය කර ගත හැකි බව පෙනේ. මෙම අභියෝගවලට පිළිතුරු සෙවිය හැකි ධර්මය හා විනය පිළිබඳ මනා අවබෝධයක් ඇති භික්ෂූන් වහන්සේලා

ශාසනය තුළම වැඩ සිටිති. බුදුදහම ලෝක ආගමකි. ලෝක ජනගහනයෙන් මිලියන 376 ක් එනම් 7.1 බෞද්ධයෝය. එය ලෝකයේ පවත්නා සිව්වන විශාලතම ආගමයි. එසේම බොහෝ බුද්ධිමතුන්ගේ විශේෂ අවධානයට ලක් වූ ආගමකි. විද්‍යාඥයෝ බෞද්ධ භාවනා ක්‍රම පිළිබඳ පර්යේෂණ සිදු කරමින් සිටිති. එසේම ජාත්‍යන්තර වශයෙන් සංවිධානාත්මකව බුදුදහමට එරෙහි විවිධ බලවේග ද ක්‍රියාත්මක වේ.[21] මෙවන් පසුබිමක් තුළ ශ්‍රී ලාංකේය බෞද්ධ සංඝ සංස්ථාව තව තවත් ශක්තිමත් විය යුතුය. වසර 2300 කට අධික කාලයක් ලෝකයේ ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායක් වන ථෙරවාද සම්ප්‍රදාය පෝෂණය කොට දිවි හිමියෙන් ආරක්‍ෂා කළේ ශ්‍රී ලාංකේය බෞද්ධ භික්‍ෂූන් වහන්සේලාය. කලක ලක්දිව සලකන ලද්දේ පිරිසිදු ථෙරවාද බුදුදහම නැමැති දිය රැඳි උල්පතක් වශයෙනි. එවන් අභිමානයක් හිමි ලාංකික භික්‍ෂුව වඩ වඩාත් දැනුමෙන් හා ආකල්ප තුළින් තවදුරටත් පෝෂණය විය යුතුය. ලෝක ආගම් සමග සංසන්දනය කිරීමේදී පැහැදිලි වන්නේ තවමත් ථෙරවාද සම්ප්‍රදාය සාම්ප්‍රදායික සංවිධානාත්මක රටාව තුළ සිරවී සිටින බවකි. නවීන ලෝකයට ගැළපෙන අයුරින් මෙහි පවත්නා සංවිධානාත්මක ව්‍යුහය සකස් කර ගත යුතුය. එබැවින් නායක ස්වාමින් වහන්සේලා බුද්ධිමය කතිකාවකට එළඹීමේ කාලය දැන් පැමිණ තිබේ. විධිමත් සාකච්ඡාවක් තුළින් පවත්නා ගැටලු බොහොමයක් විසඳ ගත හැකිය. එබැවින් පවත්නා සමාජ, දේශපාලන හා ආර්ථික පසුබිම තුළ භික්‍ෂුවගේ සීමාව කොතැනද යන්න පැහැදිලිව හඳුනාගත යුතුය. සියල්ලන් සතුටු කිරීම කිසි සේත්ම කළ නොහැක්කකි. එබැවින් සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

01. භික්‍ෂුව සම්බන්ධයෙන් පොදුවේ වගකිව හැකි යාන්ත්‍රණයක් ඇති කිරීම

02. ලාංකේය භික්‍ෂූන්ට ගැළපෙන, අවම වශයෙන් එකගවියහැකි කරුණු මුල්කරගෙන හෝ කතිකාවතක් ඇති කිරීම

03. ශාසනික තනතුරු ප්‍රධානය කිරීමේ දී ධර්මය හා විනය පිළිබඳ ඇති දැනුම පරීක්‍ෂා කිරීම

04. ධර්මය විකෘති කිරීම නීතිය මගින්ම තහනම් කිරීම, හිතු මතේ සිදු කරන ත්‍රිපිටක පරිවර්ථනය කිරීම්, පොත්පත් රචනා කිරීම්, ධර්ම දේශනා පැවැත්වීම් පාලනය කිරීම හා වෙනත් සම්ප්‍රදායයන් බිහිකරීම නතර කිරීම හෝ ප්‍රධාන නිකාය තුනේ අධීක්‍ෂණය සහිතව ඒවා පවත්වාගෙන යාම

05. 2002 බුද්ධ ශාසන කොමිෂන් සභා වාර්තාවේ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට මැදිහත් වීම

## ආන්තික සටහන්

1. ''ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.'' ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, දෙවන පරිච්ඡේදය, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය, 2021, 03 පිටුව

2. 2002 බුද්ධ ශාසන ජනාධිපති කොමිෂන් සභා වර්තාවේ බුදුදහම, භික්‍ෂූන් වහන්සේ ඇතුලු බෞද්ධ සංකෘතික අංගයන් ආරක්‍ෂා කිරීම හා සංවර්ධන සඳහා ඉතා වැදගත් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර තිබේ. එහෙත් මේ දක්වා ඒවා ක්‍රියාත්මක කරවීමට නිසි මැදිහත් වීමක් භික්‍ෂූන් වහන්සේලා විසින් සිදු කර නොමැත. බොහෝ බෞද්ධ ජනයාගේ ඉල්ලීම් මත මෙම කොමිෂම පත් කර ඇති අතර අද වන විට එහි නිර්දේශ සියල්ලම යටපත් වී ඇත. 2002 බුද්ධ ශාසන ජනාධිපති කොමිෂන් සභා වර්තාවේ නිර්දේශ සම්පිණ්ඩනය, බුද්ධ ශාසන අමාත්‍යංශය, 2004.

3. ''යො බො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා ති'' දී.නි. II, මහපරිනිබ්බාන සූත්‍රය, බු.ජ.මු., 242 පිටුව.

4. ම.නි. ගොපක මොග්ගල්ලාන සූත්‍රයේ දී මෙම කරුණ පිළිබඳ වැදගත් විස්තරයක් සඳහන්වේ. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව දේශනා කරන ලද්දක් වන මෙම සූත්‍රයේදී වස්සකාර ඇමතියා ආනන්ද හිමියන්ගෙන් විමසන්නේ බුදුරදුන් විසින් උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව පිහිට කොට ගත යුතු කිසියම් භික්‍ෂුවක් පත් කළේද නැතහොත් භික්‍ෂූන් විසින් සම්මුතියෙන් කිසියම් භික්‍ෂුවක් පත් කර ගෙන ඇත්තේ ද යනුවෙනි. එවැනි පුද්ගල නායකත්වයක් නොමැති

බව පවසන ආනන්ද හිමි, බුදුරදුන් විසින් අනුදත් පරිදි භික්ෂූන් විසින් පිළිපැදිය යුතු ප්‍රාතිමෝක්ෂ උදෙසීම, යම් භික්ෂුවක් විසින් විනය ශික්ෂා සමූහනය කළ විට අනුගමනය කළ යුතු විනයානුකූල ක්‍රමවේද ආදිය පිළිබඳව වස්සකාර ඇමතියාට පැහැදිලි කළේය. ම.නි. III, බු.ජ.මු., 100-114 පිටු.

5. බුදුරදුන් තමන් වහන්සේගෙන් පසු පුද්ගල නායකත්වයක් නම් කර නොතිබුනද මහා කාශ්‍යප තෙරුන් සමග චීවරය හුවමාරු කර ගැනීමෙන් ද තමන් සේම ධ්‍යානයට සමවැදීමේ හැකියාව මහා කාශ්‍යප තෙරුන්ට ඇති බව පැවසීම ආදීය තුළින් තමන්ගෙන් පසු නායකත්වය පිළිබඳ කිසියම් ඉඟියක් දැක්වෙන අයුරු සමන්තපාසාදිකාවෙන් පැහැදිලි වේ. *සමන්තපාසාදිකානාම විනය අට්ඨකථා I*, සෝමාවතී හේවාවිතාරණ පදනම, 130, හික්කඩුවේ සුමංගල මාවත, කොළඹ 10, 04 පිටුව.

6. ''බහු නායකත්වය නම් ශාසන විලෝපනයට ඒකාන්ත හේතු...''ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, *පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්*, 1995, 159 පිටුව.

7. ධීරානන්ද හිමි, හඟුරන්කෙත, *පුරාණ ශ්‍රී ලාංකේය සංඝ සංවිධානය සහ එහි ව්‍යුහාත්මක පදනම*, 2005, 159 පිටුව.

8. තායිලන්තයේ භික්ෂූන් අතර චරපුරුෂ සේවයක් ක්‍රියාත්මක වන බව සැලකේ. විනය විරෝධී ක්‍රියා සිදු කරන භික්ෂූන් නීතියට හසුකර ගැනීමට මෙය හිටි හැටියේම ක්‍රියාත්මක වේ. විවිධ අවස්ථාවල දී පොලිස් නිලධාරීන් පැමිණ භික්ෂූන් අත්තඩංගුවට ගත් අවස්ථා වාර්තා වේ. විමලසිරි හිමි, බෝයගම, තායිලන්ත බෞද්ධ සංස්කෘතිය, ගොඩගේ පොත් මැදුර, කොළඹ 10, 2003, 82-87 පිටු.

9. පුෂ්පබණ්ඩාර සන්නස්ගල විසින් රචිත සිංහල සාහිත්‍ය වංශයෙහි මෙම වකවානුවල පැවැති ශාස්ත්‍රීය ප්‍රබෝධය මැනවින් දක්වා ඇත.

10. 'Seminary' නමින් හඳුන්වන කිතු දහමේ පූජකවරුන් පුහුණු කරන ආයතන විශාල ප්‍රමාණයක් ලංකාවේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇත. මහනුවර අම්පිටියේ පිහිටා ඇති The National Seminary of Our Lady of Lanka එවැනි ලෝකප්‍රකට ආයතනයකි.

11. ධීරානන්ද හිමි, හඟුරන්කෙත, පුරාණ ශ්‍රී ලාංකේය සංඝ සංවිධානය සහ එහි ව්‍යුහාත්මක පදනම, 2005, 159-162 පිටු

12. දුටුගැමුණු රජු හා තිස්ස අතර ඇති වූ අරගලය මැඩපැවැත් වූයේ භික්ෂූන් වහන්සේලාය (ම.ව., 24 පරි., 42-59 ගාථා), වළගම්බා රජු සොළින් සමග කළ සටනින් පැරද පලා ගොස් සැඟව සිටිය දී ආරක්ෂාව සැලසුවේ කුත්තිකකුල මහා තිස්ස නම් තෙර කෙනෙක් විසිනි (ම.ව., 33 පරි., 50-55 ගාථා).

13. රටෙහි දේශපාලන අස්ථාවරත්වයක් ඇතිවිට ඒ සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම බුදුදහම ලක්දිවට පැමිණීමත් සමගම ඇති වූවකි. රජු හා භික්ෂූන් වහන්සේලා අතර සම්බන්ධය ගහට පොත්තක් මෙන් පැවතියේය. ශාසනය දුර්වල වන විට රජු මැදිහත් වූ අතර රාජ්‍ය දුර්වල වන විට භික්ෂූන් වහන්සේලා මැදිහත් විය. මෙම තත්ත්වය වෙනස් වන්නේ බටහිර ජාතීන් මෙරටට පැමිණීමත් සමගය. රාහුල හිමි, වලපොල, *භික්ෂුවගේ උරුමය*, එස්. ගොඩගේ සහ සමාගම, කොළඹ 10, 2012.

14. දී.නි. මහාසුදස්සන සුත්ත, දී.නි. චක්කවත්තිසීහනාද සූත්‍රය, දී.නි. කූටදත්ත සූත්‍රය, දී.නි. අග්ගඤ්ඤ සූත්‍රය, දී.නි. සමාඤ්ඤඵල සූත්‍රය වැනි සූත්‍රවල මෙන්ම ත්‍රිපිටකයේ බොහෝ තැන්වල දේශපාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා බුදුරදුන් රජවරුන් සමග පැවති සබඳතා දැක ගත හැකිය.

15. 1940 පමණ වන විට ලංකාවේ නිදහස් අරගලයේ උච්චතම කාල සීමාව විය. විවිධ දේශප්‍රේමී ජනකොටස් නිදහස වෙනුවෙන් කටයුතු කරද්දී භික්ෂූන් වහන්සේලා ද එහි කැපී පෙණෙන චරිත බවට පත්ව සිටියහ. බොහෝ විට මේ සඳහා කැපවූ උඩකැන්දවල සරණංකර හිමි, වල්පොළ රාහුල හිමි, බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි වැනි ප්‍රකට භික්ෂූන් වහන්සේලා වාමාංශික නැඹුරුවක් තිබූ අය වූහ. වල්පොළ රාහුල හිමි ප්‍රසිද්ධියේ දේශපාලන රැස්වීම්වල කථා පැවැත් වූ අතර භික්ෂූන්ගේ මෙම වාමාංශික නැඹුරුවට ඩී.එස්. සේනානායක මහතා ප්‍රසිද්ධියේ චෝදනා කළේය. එයට පිළිතුරක් වශයෙන් භික්ෂුවගේ දේශපාලනයේ පරමාර්ථය ඉදිරිපත් කරමින් සුප්‍රකට ''විද්‍යාලංකාර ප්‍රකාශය'' එළි දැක්විනි. එහිදී දේශපාලනය යන්න මෙන්ම එහි නිරතවීමට භික්ෂුවට ඇති අයිතිය ද මැනවින් අර්ථකථනය විය. 1956 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා අගමැති බවට පත් කරන්නේ මෙම භික්ෂු දේශපාලනය හරහා මතු වූ බලපෑමයි. මෙම දේශපාලන ක්‍රියාවලියට ඍජුව මෙන්ම වක්‍රව දායකත්වය දැක් වූයේ එම යුගයේ වැඩ සිටි සුප්‍රකට භික්ෂූන් වහන්සේලාය. විද්‍යාලංකාර පිරිවෙනේ වැඩසිටි යක්කඩුවේ ප්‍රඥාරාම, කොටහේනේ පඤ්ඤාකිත්ති, කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර, වල්පොළ රාහුල වැනි භික්ෂූන් වහන්සේලා ඒ සඳහා ඍජුවම මැදිහත් වූහ. එම දේශපාලන රටාව දෙස බලන විට වර්තමාන භික්ෂු දේශපානය තුළ නොමැති ප්‍රබුද්ධ ස්වරූපයක් තිබුනි. එම භික්ෂූන් වහන්සේලා ධර්ම-විනය දත් මහ පඬිවරුද වූහ. අයිවන්, වික්ටර්, පන්සලේ විප්ලවය, රාවය, 2006, 171-207 පිටු.

16. අංගුත්තර නිකායේ අනාගතභය සූත්‍ර තුළ අනාගතයේ සසුන තුළින්ම ශාසනය පිරිහීමට පත්වන ආකාරය පෙන්වා ඇත. නොවැඩූ කාය, ශීල, චිත්ත, ප්‍රඥා ඇති භික්ෂූන් අන්‍යන් උපසම්පාදා කරන බව ද නිසා

දෙන බවද එහෙත් තමා මැනවින් ශික්ෂණයෙහි නොපිහිටා අන්‍යයන් හික්මවීම කළ නොහැක්කක් බව දක්වයි. එසේම බුදුරදුන් දෙසූ ගැඹුරු ධර්මය ඇසීමට රුචි නොකරන බවත් කවියෙන් හෝ ඕලාරික ලෙස දෙසන ධර්මය ඇසීමට රුචි කරන බවත් දක්වා ඇත. අං.නි. III, බු.ජ.මු., 162-174 පිටු.

17. ම.ව. පරි. 4, 50 ගාථාව, ම.ව. පරි. 5, 271-272 ගාථා

18. ක්‍රි.ව. 269 දී වෝහාරිකතිස්ස රජ දවස වෛතුල්‍යවාද නමින් පැමිණි ඉගැන්වීම රජු ධර්මය පිළිබඳ මනා අවබෝධයක් ඇති කපිල නම් අමාත්‍යයාගේ සහය ඇතිව මෙම ඉගැන්වීම් අධර්මවාදී යැයි තීරණය කොට බැහැර කළ බව මහාවංශයේ සඳහන්වේ (ම. ව. 36 පරි. 31-33 ගාථා). මහාවිහාර වාසී ථෙරවාදී භික්ෂූන් ද මෙම වෛතුල්‍යවාදය ධර්ම විනය සමග ගලපා නොගැලපෙන බැවින් ප්‍රතික්ෂේප කළ බව නිකාය සංග්‍රහයේ සඳහන් වේ(නි.ස. 12 පිටුව). පොළොන්නරුවේ මහපැකුම්බා රජු එවකට මෙහි ප්‍රචලිතව පැවති ධර්මරුචි, සාගලික හා වෛතුල්‍ය යන සම්ප්‍රදායන් තුන එක්කොට, දුසිල්වතුන් ශාසනයෙන් නෙරපා සසුන පිරිසිදු කළ බව නිකායසංග්‍රහයේ සඳහන් වේ ( නිකාය සංග්‍රහය, සංස්. බන්දුසේන ගුණසේකර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1984, 15 පිට). එහෙත් මහාවංසයේ දැක්වෙන්නේ මහාවිහාර, අභයගිරි හා ජේතවන යන නිකායන් තුන සමගි කළ බවයි.

19. ''සම්මතයක් ලද තෙනක්මුත් ඒ ඒ තෙන අසම්මත වැ බණ නොකිය යුතු.'' ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, *පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්*, 1995, 161 පිටුව.

20. දඹදෙණි කතිකාවතෙහි කුල දරුවකු සසුන්ගත කිරීමේ දී හා උපසම්පදාවේදී කෙතරම් වගකීමකින් යුක්තව එය සිදු කළ යුතුද යන්න පැහැදිලිව දක්වා ඇත. සුදුසුකම් පරීක්ෂා කර බලා පැවිදි කර නියමිත බණ දහම් ප්‍රගුණ කරවා නිසි කල් පැමිණීමෙන් පසු රාජ සම්මතයෙන් උපසම්පදා කළ යුතු බව දක්වා තිබේ. ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ, *පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්*, 1995, 156 පිටුව.

21. බංගලිදේශයේ නිරන්තරයෙන් දැනට සුළුතරයක් වී සිටින බෞද්ධ භික්ෂූන්ට හා ජනතාවට සිදුවන හිංසා, උතුරු තායිලන්තයේ බෞද්ධ භික්ෂූන්ට වන පීඩාදිය ජාත්‍යන්තර මාධ්‍ය පවා වාර්තා කරන්නේ කලාතුරකිනි. මියන්මාරයේ රෝහින්ග්‍යා ප්‍රදේශයේ කලක් තිස්සේ බෞද්ධයින්ට සිදු වූ කෙනෙහිලිකම් ජාත්‍යන්තරයේ අවධානයට ලක් නොවූවද පසුව බෞද්ධයින් සංවිධානාත්මකව එම ගැටලුවලට ප්‍රතිචාර දැක්වීම ජාත්‍යන්තර ප්‍රජාවගේ විරෝධයට හේතු විය. ලංකීය බෞද්ධයින් හා භික්ෂූන් වහන්සේලා පිළිබඳ විවිධ වැරදි අර්ථකථන ජාත්‍යන්තර වශයෙන් ප්‍රචාරය කරමින් අපකීර්තියට පත් කිරීමේ සංවිධානාත්මක වැඩ සටහන් ක්‍රියාත්මක වන බව පෙනේ.